**කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පුස්තකාල ගොඩනැගිල්ලේ ඉහළ මහලේ අත්වැට ඉදිකිරීම සඳහා දරන ලද රු.32,800 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉහළ මාලය අලුත්වැඩියාවන් වෙනුවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු රු.43,742ක් වෙනුවෙන් පිළිවෙළින් ණයගැති හා ණයහිමි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ආදායම් ශීර්ෂ 4 ක් වෙනුවෙන් කලින් ලද රු.45,767 ක් හා ආදායම් ශීර්ෂ 04 කට අදාළව අධි ගාස්තු ලෙස බිල් කරන ලද රු. 98,495 ක් අදාළ ආදායම් ශීර්ෂ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මැයි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු වෙනුවෙන් හා නිදහස් දුම්රිය බලපත්‍ර සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.38,600 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | මුද්දර ගාස්තු නිවැරදි කිරීමට කටයුතු කරන බව හා සමාලෝචිත වර්ෂය අවසානයට දුම්රිය බලපත්‍ර ගාස්තු ප්‍රමාණය නොදන්නා නිසා ප්‍රතිපාදන සලස්වා නොමැති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | රු.154,749 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 59 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.64,017,172 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි ශේෂය සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | එකඟ වන බව. | අදාල ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්ථන වියදම රු. 6,567,491 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.4,683,492 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,661,562 | 1,661,155 | 1,810,035 | 660,079 | 1,025,485 | 922,123 | 828,320 | 808,959 |
| (ii) | කුලී | 6,394,400 | 3,858,035 | 3,810,403 | 424,130 | 4,915,200 | 1,643,740 | 1,643,524 | 376,498 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 285,060 | 270,561 | 272,961 | 35,925 | 330,100 | 484,510 | 543,360 | 38,325 |
| (iv) | වෙනත් ආදායම් | 1,638,500 | 3,845,936 | 3,845,936 | - | 1,678,200 | - | - | - |
| | | 9,979,522 | 9,635,687 | 9,739,335 | 1,120,134 | 7,948,985 | 3,050,373 | 3,015,204 | 1,223,782 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.808,959 ක් වූ අතර, වරිපනම් ඒකක 565 කට අදාළව බිල් කිරීම් රු.1,661,155 ක් සමඟ රු.2,470,114 ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම රු.1,810,035 ක් වීම නිසා වර්ෂය | 2024 මාර්තු 31 දින වන විට එම හිඟ ශේෂයෙන් රු.145,616 අයකර ගෙන ඇති බවත් ඉතිරි හිඟයද අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවසානයට වරිපනම් ඒකක 161 කට අදාළව රු.660,079 ක හිඟ ශේෂයක් පැවතුනි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ශේෂ පැවති කඩ කාමර 17 න් කඩ කාමර 06 කට අදාළව රු.10,000 ට වැඩි හිඟ ශේෂ පැවති අතර, එය මුළු හිඟ කඩකාමර සංඛ්‍යාවෙන් සියයට 35 ක ප්‍රතිශතයක් විය. | 2024 මාර්තු අවසන් වනවිට රු.36,490 ක් අය කර ගැනීමෙන් පසු රු.126,834 ක හිඟයක් අයවිය යුතුව පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් මුද්දර ගාස්තු ලෙස රු.1,276,947 ක් ලැබිය යුතුව තිබුණි. | 2024 මාර්තු 31 දින වන විට රු.1,276,000 ක මුදලක් ලැබී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බලප්‍රදේශය තුල දෛනිකව රැස්කරනු ලබන කසල කිලෝග්‍රෑම් 1500 ක ප්‍රමාණයෙන් කිලෝග්‍රෑම් 800 කට ආසන්න ප්‍රමාණයක් කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කර තිබුණු අතර විගණිත දිනය වූ 2023 ඔක්තෝබර් 26 දින වන විට කසළ කිලෝග්‍රෑම් 240,000 කට ආසන්න ප්‍රමාණයක් එක්රැස් කර තිබූ නමුත් එම කාලසීමාව තුළ නිෂ්පාදනය කර තිබූ කොම්පෝස්ට් තොග ප්‍රමාණය කිලෝග්‍රෑම් 9,670 ක් විය. ඒ අනුව කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යොදා ගත හැකි කසළ ප්‍රමාණයට සාපේක්ෂව කොම්පෝස්ට් නිෂ්පාදනය සියයට 4.03 ක් තරම් පහළ අගයක් විය. | රජයේ පොහොර ප්‍රතිපත්තිය අනුව කාබනික පොහොර අලෙවිය අඩු වැඩිවීම සිදුවන බවත්, පොහොර හලා ගොඩගසා තැබීම සිදු නොකරන අතර ඇණවුම අනුව පොහොර සකස් කර ලබාදෙන බව. | විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් අනුගමනය කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 10 (6) වගන්තිය ප්‍රකාරව 2016 සිට 2020 දක්වා කාලපරිච්ඡේදය තුළ අනුමත කල ගොඩනැගිලි අයදුම්පත්‍ර 153 ක් සඳහා සංවර්ධන බලපත්‍ර ලබාදී වසර 03 ත් 07 ත් අතර කාලයක් ගත වී | ඉදිරියේදී අදාළ ගොඩනැගිලි හිමිකරුවන් දැනුවත් කරමින් අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| තිබූ නමුත් ඉන් ගොඩනැඟිලි 57 කට පමණක් අනුකූලතා සහතික ලබා ගෙන තිබුණි. | | |
| (ආ) 2019 වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් තොරව අවිධිමත් ලෙස ක්‍රියාත්මක කර තිබූ උදාගම්මාන නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 1982 අංක 04 හා 1984 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත මගින් සභාව වෙත පැවරී ඇති බලතල හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදී මෙම අනවසර ඉදි කිරීම නීත්‍යානුකූල කර වීම සඳහා කටයුතු කරමින් සිටින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන හා 2020 ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ කොන්ක්‍රීට් පැති කාණු, පැති බැමි හා බෝක්කු ඉදිකිරීමේ කර්මාන්ත 09 ක කොන්ක්‍රීට් බැමි ඉදිකිරීමේදී පදනම සකස් කිරීම සඳහා කාණු කැපීමේ වැඩ විෂයට අදාළව ඇස්තමේන්තු සකස් කිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2019 පළමු භාගය සඳහා DR-005A යටතේ හඳුන්වාදුන් රු.664.22 රේටය වෙනුවට E1-003 යටතේ හඳුන්වාදී තිබූ රු.1,108.30 රේටය භාවිතා කිරීම නිසා පස් ඝන මීටරයකට රු.444.08 ක් බැගින් පස් ඝන මීටර් 324 ක් සඳහා රු.143,882 ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | ඉදිරියට ඇස්තමේන්තු සැකසීමේදී හා බිල්පත් ගෙවීමේදී මිළ විශ්ලේෂණයන් අදාළ ආයතන මගින් ලබාගෙන ඒ පිළිබඳව අවධානය යොමුකර කටයුතු කරන බව. | නියමිත රේටයන් භාවිතා කළ යුතුය. |